තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් තොරතුරු තාක්ෂණ සංරචකය සඳහා නිකුත් කරන ලද අමතර කියවීම් පොත හෝ පැතුරුම්පත් මෘදුකාංග පිළිබඳ වෙනත් මූලාශ්‍ර ඇසුරින් පිළිතුරු ලබාගන්න

1. පහත දැක්වෙනුයේ බහුලව පැතුරුම්පත් මෘදුකාංගවල භාවිතාවන ශ්‍රිත කිහිපයකි. ඒවායේ කාර්යයන් හඳුන්වන්න

| ශ්‍රිතය | කාරක රීතිය | යෙදීම |
|---|---|---|
| 1. SUM | = SUM(range) | උදා: කෝෂ පරාසයක ඇති සංඛ්‍යාවල එකතුව ලබාදෙයි |
| 2. AVERAGE | =AVERAGE(range) | |
| 3. MAX | = MAX(range) | |
| 4. MIN | = MIN(range) | |
| 5. COUNT | = COUNT(range) | |
| 6. ROUND | = ROUND(range) | |
| 7. RANK | = RANK(range) | |

2. පහත දැක්වෙන ශ්‍රිතවලට කෝෂ - කොටු යොමු කළ හැකි ආකාර 3කි. ඒවා හඳුනාගන්න.

1. සාපේක්ෂ කෝෂ -කොටු යොමු ( Relative cell reference)
2. නිරපේක්ෂ කෝෂ -කොටු යොමු (Absolute cell reference)
3. මිශ්‍ර කෝෂ -කොටු යොමු ( Mixed cell reference)

3. පහත වගුවේ දත්තයන් සඳහා එක් එක් අවස්ථාවට අදාළ වන ශ්‍රිතයන් ලියා දක්වන්න

| | A | B | C | D | E | F | G | H | I | J |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | නම | ගණිතය | විද්‍යාව | සිංහල | ආගම | ඉංග්‍රීසි | එකතුව | සාමාන්‍ය | ස්ථානය | සාමාර්ථය |
| 2 | කමල් | 80 | 75 | 70 | 75 | 60 | | | | |
| 3 | නිමල් | 60 | 55 | 65 | 70 | 50 | | | | |
| 4 | සමන් | 80 | 90 | 85 | 75 | 70 | | | | |
| 5 | චාමර | 35 | 40 | 60 | 55 | 50 | | | | |
| 6 | සිගිති | 90 | 95 | 95 | 80 | 80 | | | | |

1. G තීරුවේ එක් එක් සිසුවා ලබාගත් ලකුණු වල එකතුව ලබා ගැනීමට අවශ්‍ය ශ්‍රිතය

2. H තීරුවේ එක් එක් සිසුවා ලබාගත් ලකුණු වල සාමාන්‍යය ලබා ගැනීමට අවශ්‍ය ශ්‍රිතය

3. I තීරුවේ එක් එක් සිසුවා ලබාගත් ලකුණු අනුව ස්ථානය ලබා ගැනීමට අවශ්‍ය ශ්‍රිතය

4. J තීරුවේ එක් එක් සිසුවාගේ ලකුණුවල සාමාන්‍ය අනුව ලබාගත් සාමාර්ථය ලබා ගැනීමට අවශ්‍ය ශ්‍රිතය ලියා දක්වන්න

4. පැතුරුම්පත් මෘදුකාංග භාවිතාකර ප්‍රස්ථාර නිර්මාණයේදී ප්‍රස්ථාරයක අංගෝපාංග , ප්‍රස්ථාරයක් සකස් කිරීමේ මූලික පියවර හා ප්‍රස්ථාරයක අකාරය වෙනස් කිරීම යන ඒවා පිළිබඳව අධ්‍යනය කරන්න